සන්නස SANNASA

# ලියා දක්වන වග

අත්හැර දැමූ පාළු ලිඳකට වැටුණු ඉන්දියානු දරුවෙකු බේරා ගැනීමේ මෙහෙයුම දෙස මුළු ලෝකයම නෙත් යොමා සිටියහ. දරුවාගේ ජීවිතය බේරාගැනීමට නොහැකිවූ පුවත වාර්තා වීමෙන් ලෝකවාසී බොහෝ දෙනෙකුගේ නෙතට කඳුළක් ගැලූ බවද තැන් තැන් වලින් වාර්තා විය. එම දරුවාගේ ජීවිතය බේරා ගැනීමට ලෝකයේ කුමන රටකින් උදව් ඉල්වුයේ නම් එය නිසැකවම ලබා දෙන බව විශ්වාසයෙන් කියා සිටිමු. මෙම මනුෂ්‍ය ගුණාංගයන්ගෙන් පිරි ලෝකය කෙතරම් ලස්සනද? එම ගුණාංගයන් දරුවන් තුළ වර්ධනය වන අයුරින් කටයුතු කිරීම වැඩිහිටි අප සැමගේ යුතුකමයි.

දරුවෙකු ලියු දයාව අනුකම්පාව ඉස්මතුවන ආකාරයේ කතාන්තරයක් වන "කොබෙයි තාත්තා" අද අප පත්‍රයේ පළවේ. ඔබගේ දරුවාත් මෙවන් කතන්දර ලිවීමට පොළඹවන්න. ඔවුන්ගේ නිර්මාණ පත්‍රයේ පලකිරීම හා ඒවා පොතක් වශයෙන් එළිදැක්වීමට අප සුදානම්.

**සංස්කරණය / Editor**
විත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**රූ රචා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්
ප්‍රසාද් විජයබන්දු

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Prasad : 0413 201 590**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# ආලින්දය



## අද ආලින්දයට ගොඩ වදින්නේ කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය බිමාලි ජයවර්ධන මැතිනියයි.

**සන්නස: අප පුවත්පත වෙනුවෙන් ඔබ තුමිය ගෞරවයෙන් පිලිගන්නවා . මුලින්ම ම අසන්නට කැමතියි ඔබ තුමියගේ පාසැල් කාලය ගැන.**

පීඨාධිපතිතුමිය : මම ඉපදුනේ කොළඹ ප්‍රදේශයේ .පළමුවැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වාම මම පාසැල් ගියේ කොළඹ විශාකා විද්‍යාලයට.ඉස්කෝලෙදි මම ක්‍රීඩා වලට සම්බන්ධ වුනා. භාහිරව මම සංගීතය ඉගෙනගෙන තියෙනවා.මට හොඳට පියානෝ වාදනය කරන්න පුළුවන්.මම පාසලේ ශිෂ්‍ය නායිකාවක්.අධ්‍යාපන කටයුතු වලිනුත් මම ඉදිරියෙන්හිටියා.

**සන්නස: උසස් අධ්‍යාපනය ගැන මතක් කරනවා නම්,**

පීඨාධිපතිතුමිය: වැඩිදුර අධ්‍යාපනය සඳහා මා ඇතුලත් වුනේ කොළඹ විශ්ව විද්‍යාලයට. එහිදී මම රසායන විද්‍යාව විශේෂවේදී උපාධිය කළා. ඉන් පසුව මම පශ්චාත් උපාධි සඳහා ඇමරිකාවේ චිකාගෝවල පිහිටි "ඉලිනොඉ විශ්ව විද්‍යාලයට" ඇතුල් වුණා. ඉන් පසු මම කෙන්ටකි ලෙක්සින්ටන් විශ්ව විද්‍යාලයට ඇතුල් වෙලා වෛද්‍ය විද්‍යාවට අදාල පර්යේෂණ වල නියැළුනා. ඉන් පසුව මම ලංකාවට ඇවිල්ල කරාපිටිය වෛද්‍ය පීඨයට ඇතුල්වෙලා එහි සේවය කළා. ඉන් පසු කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරියක් හැටියට සේවය කළා. මට මහාචාර්ය පදවිය ලැබුණේ 2009 අවුරුද්දේ. ඉන්පසු මම රසායන විද්‍යා අංශාධිපති හැටියට පත් වුණා. 2017 අවුරුද්දේ තමයි විද්‍යා පීඨයේ පීඨාධිපති තනතුරට පත් වුනේ.

**සන්නස: විද්‍යාපීඨයේ පීඨාධිපති වශයෙන් එහි ඇති සියලුම වගකීම් ඔබතුමිය වෙත පැවරී තියෙන්නේ. විශ්ව විද්‍යාලයේ නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තියෙන ගැටලුවක් තමයි නවක වධය කියන එක. ජන මාධ්‍ය මගින් දැක තිබෙනවා නවකවදය නිසා සමහර ශිෂ්‍යාවෝ විශ්වවිද්‍යාල හැර යන. අවස්ථාවන් හා සියදිවි හානි කරගත්ත සිද්ධීන්. ඔබතුමිය නවක වදය දකින්නේ කුමන ආකාරයටද?**

පීඨාධිපතිතුමිය: නවක වධය කියන එක මම නම් කිසිම ආකාරයකින් අනුමත කරන්නේ නෑ. එපමණක් නෙමේ, විශ්වවිද්‍යාලය තුළ මෙය වලක්වාලීමට අපි නොයෙක් ආකාරයෙන් කටයුතු කරනවා. යම්කිසි ආකාරයකට අපිට මේ ගැන වාර්තා වුවහොත් අප ඊට සම්බන්ධ අයට දඬුවම් දෙන්නට පසුබට වෙන්නේ නැහැ.